# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/04 - 2022 මාර්තු මස 28 වැනි සඳුදා - 2022.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016 (III)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2019 මාර්තු මස 15 වන දින අංක 2114/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සහ 2021 අගෝස්තු මස 19 වන දින අංක 2241/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සංශෝධිත, 2017 පෙබරවාරි මස 17 වන දින අංක 2006/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2017 අංක 01 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. (1) යම් වෙළඳ නාමයකින් හෝ අනුමත නාමයකින් හෝ විස්තර කර ඇති මෙහි උපලේඛනයේ III වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති යම් නිෂ්පාදකයකු විසින් නිෂ්පාදනය කර ඇති (මෙහි මින්මතු

1A - G 36470 — 15 (2022/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

"උපලේඛනගත වෛද්‍ය උපකරණ" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ නාමයෙන් හෝ අනුමත නාමයෙන් වන වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ IV වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට හෝ 3(2) වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශෝධිත සිල්ලර මිලට වඩා වැඩි මිලකට එම උපලේඛනගත වෛද්‍ය උපකරණ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අයකිරීම කරනු නොලැබිය යුතු ය." ;

(2) එහි 2 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"3. (1) විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින්ම උපලේඛනගත වෛද්‍ය උපකරණවල මිල, උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිලෙහි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග පළකරනු ලබන දිනයේ දී, මෙහි උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු වන්නාවූ, 2021 අගෝස්තු මස 19 වන දින අංක 2241/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද වෛද්‍ය උපකරණ (මිල නියම කිරීම) නියෝග යටතේ වන ප්‍රතිශෝධිත සිල්ලර මිලකට යම් වෛද්‍ය උපකරණ විකුණනු ලබන නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින්, එම ප්‍රතිශෝධිත සිල්ලර මිල සමානුපාතිකව සම්පූර්ණ වශයෙන් සියයට විසි නවයක ප්‍රතිශතයකින් (29%) වැඩි කරනු ලැබිය හැකි ය ;

එසේවුව ද, උපලේඛනගත වෛද්‍ය උපකරණවල ප්‍රතිශෝධිත සිල්ලර මිලෙහි එවැනි වැඩි කිරීමක් මෙහි උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල නොඉක්මවිය යුතු ය.";

(3) එහි 4 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"4. යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් මෙහි උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල නිෂ්පාදිත හෝ වෙළඳපොළේ පවතින තොගයේ උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් මුද්‍රණය කිරීම හෝ සලකුණු කිරීම කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මේ නියෝග පළකරනු ලබන දින සිට දින හතලිස්පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත මුද්‍රණය කිරීම හෝ සලකුණු කිරීම කරනු ලැබිය යුතු ය.";

(4) එහි 5 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"5. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය.";

(5) එහි 6 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"6. උපලේඛනගත වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම, විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක්, හෝ තැනැත්තකුගේ ම වගකීම විය යුතු ය.";

(6) එහි 6 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

6අ. උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ නාමය හෝ අනුමත නාමය සහ උපලේඛනගත වෛද්‍ය උපකරණවල එම වෙළඳ නාමයේ හෝ අනුමත නාමයේ උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් එම වෙළඳ නාමයෙන් හෝ අනුමත නාමයෙන් වන උපලේඛනගත වෛද්‍ය උපකරණ සඳහා වන මිල නියම කරනු ලැබිය යුතු ය.";

(7) එහි 7 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"7. මේ නියෝගවල-

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ; සහ

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය." ;

(8) එහි උපලේඛනය ඉවත්කර පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

**"උපලේඛනය**

(2 වන නියෝගය)

**අක්ෂි කාච/ ඩිලිවරි සිස්ටම් සමග අක්ෂි කාච (ප්‍රිලෝඩඩ්/ කාට්‍රිජය සහිත)**

| *I වැනි තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| | වෙළඳ නාමය/ අනුමත නාමය | නිෂ්පාදකයා | උපරිම සිල්ලර මිල (MRP) (ශ්‍රී ලංකා රුපියල්) |
| 1. | ඇක්‍රිස(ර්)ට් ප්‍රිලෝඩඩ් ඩිලවරි සිස්ටම් | ඇල්කෝන් | රු. 27,348.00 |
| 2. | ඇක්‍රිසෝෆ් IQ SN60WF කාට්‍රිජය සහිත | ඇල්කෝන් | රු. 26,378.44 |
| 3. | ටෙක්නිස් 1 පීස් | ඇබෝට් මෙඩිකල් | රු. 26,055.03 |
| 4. | එන් විස්ටා | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | රු. 24,930.15 |
| 5. | ටෙක්නිස් මොනොෆොකල් | ඇබෝට්මෙඩිකල් | රු. 24,930.15 |
| 6. | හෝයා අයිස(ර්)ට් 251 | හෝයා | රු. 19,474.49 |
| 7. | නයිඩෙක් නෙක්ස්-ලෝඩ් සිස්ටම් SP SZ-1 | නයිඩෙක් | රු. 19.474.49 |
| 8. | ඇක්වා සෙන්ස් ආරිස් | ආරෙන් සයන්ටිෆික් | රු. 15,762.38 |
| 9. | බයි-ෆ්ලෙක්ස් HB (877FABY ස්ටෑන්ඩඩ් අයි ඕ එල්) | මෙඩිකොන්ට්‍යු(ර්) | රු. 14,342.22 |
| 10. | බනී HP | හනිටා මාකටින් | රු. 13,990.70 |
| 11. | අයි-ස්ට්‍රීම් ප්‍රීලෝඩඩ් | MD ටෙක් | රු. 11,902.64 |
| 12. | ඕරොවිව් EV | ඕරොලැබ් | රු. 7,965.56 |
| 13. | ඇක්‍රිසෝෆ් SP SA 60 AT කාට්‍රිජය සහිත | ඇල්කෝන් | රු. 21,091.50 |
| 14. | ඇක්‍රිසෝෆ් එක්ස්පැන්ඩ් MA 60 MA කාට්‍රිජය සහිත | ඇල්කෝන් | රු. 21,091.50 |
| 15. | සෙන්සර් 1 පීස් | ඇබෝට් මෙඩිකල් | රු. 20,592.27 |
| 16. | සෙන්සර් | ඇබෝට් මෙඩිකල් | රු. 18,912.05 |

| *I වැනි තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| | වෙළඳ නාමය/ අනුමත නාමය | නිෂ්පාදකයා | උපරිම සිල්ලර මිල (MRP) (ශ්‍රී ලංකා රුපියල්) |
| 17. | ඇක්‍රිසෝෆ් MP MA 60 AC | ඇල්කෝන් | රු. 17,210.66 |
| 18. | හෝයා PY 60R | හෝයා | රු. 12,711.14 |
| 19. | ඇක්‍රිවා UD (බ්ලූ ෆිල්ටර්) | VSY බයෝටෙක් | රු. 11,108.19 |
| 20. | සුප්‍රා ෆෝබි ප්‍රීලෝඩඩ් සිස්ටම් | අප්පසාමි | රු. 10,461.38 |
| 21. | ඇක්‍රිවා UD | VSY බයෝටෙක් | රු. 10,545.75 |
| 22. | ඇක්‍රිඔස් - MI 60 | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | රු. 23,812.30 |
| 23. | ඇක්‍රිඔස් AO | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | රු. 18,658.95 |
| 24. | ඇක්‍රිඔස් ඇඩප්ට් | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | රු. 17,435.64 |
| 25. | බනි AFM | හනිටා මාකටින් | රු. 17,084.12 |
| 26. | CT ඇස්ෆිනා 404 | කාල් සීස් මෙඩිටෙක් | රු. 16,873.20 |
| 27. | CT ස්ෆෙරිස් 204 | කාල් සීස් මෙඩිටෙක් | රු. 13,189.22 |
| 28. | බනි AF | හනිටා මාකටින් | රු. 11,586.26 |
| 29. | C - ෆ්ලෙක්ස් ඇස්ෆෙරික් 970 C/920H | රේන(ර්) | රු. 9,702.09 |
| 30. | ඇස්පිරා - aAy | හ්‍යුමන් ඔප්ටික්ස් | රු. 9,167.77 |
| 31. | ඔක්‍යුවා | VSY බයෝටෙක් | රු. 6,439.94 |
| 32. | ඕරොෆ්ලෙක්ස් | ඕරොලැබ් | රු. 2,896.57 |
| 33. | සීලෙන්ස් | හනිටා මාකටින් | රු. 9,976.28 |
| 34. | C - ෆ්ලෙක්ස් IOL (ස්ෆෙරිකල් 570C) | රේන(ර්) | රු. 8,225.69 |
| 35. | ඇස්පිරා AS | හ්‍යුමන් ඔප්ටිකල්ස් | රු. 8,366.30 |
| 36. | ටෙක්සොෆ්ට් ටෙට්‍රා | ෆ්‍රෙඩ් හොලොව්ස් | රු. 7,733.55 |
| 37. | ටෙක්සොෆ්ට් ෆ්ලෙක්ස් | ෆ්‍රෙඩ් හොලොව්ස් | රු. 7,241.42 |
| 38. | ඇක්‍රිෆෝල්ඩ් | අප්පසාමි | රු. 4,921.35 |

EOG 03 - 1012/1

---

එල්.ඩී.බී. 9/2016 (III)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

## නියෝග

2019 මාර්තු මස 15 වන දින අංක 2114/54 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සහ 2021 අගෝස්තු මස 19 වන දින අංක 2241/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සංශෝධිත, 2017 අගෝස්තු මස 04 වන දින අංක 2030/47 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2017 අංක 05 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. (1) යම් වෙළඳ නාමයකින්, මාදිලිවලින්, ප්‍රමාණවලින් හෝ ඇසුරුම් ප්‍රමාණවලින් විස්තර කර ඇති (මෙහි මින්මතු "උපලේඛනගත වෛද්‍ය උපකරණ" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය." ;

(2) උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින්, උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට හෝ 3(2) වන නියෝගයේ විධිවිධාන වලට අනුකූලව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශෝධිත සිල්ලර මිලට වඩා වැඩි මිලකට එම උපලේඛනගත වෛද්‍ය උපකරණ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අයකිරීම කරනු නොලැබිය යුතු ය.";

(2)එහි 3 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"3. (1) විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින් උපලේඛනගත වෛද්‍ය උපකරණවල මිල, උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිලෙහි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග පළකරනු ලබන දිනයේ දී, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩුවන්නා වූ, 2021 අගෝස්තු මස 19 වන දින අංක 2241/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද වෛද්‍ය උපකරණ (මිල නියම කිරීමේ) නියෝග යටතේ වන ප්‍රතිශෝධිත සිල්ලර මිලකට යම් වෛද්‍ය උපකරණ විකුණනු ලබන නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් එම ප්‍රතිශෝධිත සිල්ලර මිල, සමානුපාතිකව සම්පූර්ණ වශයෙන් සියයට විසිනවයක ප්‍රතිශතයකින් (29%) වැඩි කරනු ලැබිය හැකි යඃ

එසේ වුවද, උපලේඛනගත වෛද්‍ය උපකරණවල ප්‍රතිශෝධිත සිල්ලර මිලෙහි එවැනි වැඩි කිරීමක්, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල නොඉක්මවිය යුතු ය.";

(3) එහි 5 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"5. යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල නිෂ්පාදිත හෝ වෙළඳපොලේ පවතින තොගයේ උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය ඃ

එසේ වුවද, මේ නියෝග පළකරනු ලබන දින සිට දින හතළිස්පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.";

(4) එහි 6 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"6. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය." ;

(5) එහි 7 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"7. උපලේඛනගත වෛද්‍ය උපකරණ වල උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකුගේ වගකීම විය යුතු ය.";

(6) එහි 7 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"8. උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ නාමය, මාදිළිය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සහ උපලේඛනගත වෛද්‍ය උපකරණවල එම වෙළඳ නාමයේ, මාදිළියේ, ප්‍රමාණයේ හෝ ඇසුරුමේ ප්‍රමාණයේ උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් එම වෙළඳ නාමයෙන්, මාදිළියෙන්, ප්‍රමාණයෙන් හෝ ඇසුරුමේ ප්‍රමාණයෙන් වන උපලේඛනගත වෛද්‍ය උපකරණ සඳහා වන මිල නියම කරනු ලැබිය යුතු ය." ;

(7)එහි 8 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"9. මේ නියෝගවල-

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට (105 වන අධිකාරය වූ)වෛද්‍ය ආඥා පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට සංස්ථාගත කළ හෝ නොකළ යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;"; සහ

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට, 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය." ;

(8) එහි උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

"උපලේඛනය

(2 වනනියෝගය)

| *අංකය* | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | *අයිතමය* | *උපරිම සිල්ලර මිල (MRP)*<br>*(ශ්‍රී ලංකා රුපියල්)* |
| 1 | ලෝහමය වටනේය. (Bare Metal Stent) | රු. 38,597.45 |
| 2 | ඖෂධ මුදා හරින වටනේය. (Drug Eluting Stent) | රු. 168,732.00 |

එල්.ඩී.බී. 9/2016 (III)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2019 මාර්තු මස 15 වන දින අංක 2114/54 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග සහ 2021 අගෝස්තු මස 19 වන දින අංක 2241/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සංශෝධිත, 2018 අගෝස්තු මස 31 වන දින අංක 2086/37 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2018 වෛද්‍ය උපකරණ (මිල නියම කිරීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. (1) යම් වෙළඳ නාමයකින්, මාදිළිවලින්, ප්‍රමාණවලින් හෝ ඇසුරුම් ප්‍රමාණවලින් විස්තර කර ඇති (මෙහි මින්මතු "උපලේඛනගත වෛද්‍ය උපකරණ" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුමත නාමයෙන් වන වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට හෝ 3 (2) වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශෝධිත සිල්ලර මිලට වඩා වැඩි මිලකට එම උපලේඛනගත වෛද්‍ය උපකරණ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අය කිරීම කරනු නොලැබිය යුතු ය.";

(2) එහි 3 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"3. (1) විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසසුලක් හෝ තැනැත්තකු විසින් උපලේඛනගත වෛද්‍ය උපකරණවල මිල, උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිලෙහි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග පළකරනු ලබන දිනයේ දී, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩුවන්නා වූ, 2021 අගෝස්තු මස 19 වන දින අංක 2241/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද වෛද්‍ය උපකරණ (මිල නියම කිරීමේ) නියෝග යටතේ වන ප්‍රතිශෝධිත සිල්ලර මිලකට යම් වෛද්‍ය උපකරණ විකුණනු ලබන නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් එම ප්‍රතිශෝධිත සිල්ලර මිල, සමානුපාතිකව සම්පූර්ණ වශයෙන් සියයට විසිනවයක ප්‍රතිශතයකින් (29) වැඩිකරනු ලැබිය හැකි ය :

එසේ වුවද, උපලේඛනගත වෛද්‍ය උපකරණවල ප්‍රතිශෝධිත සිල්ලර මිලෙහි එවැනි වැඩි කිරීමක්, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල නොඉක්මවිය යුතු ය.";

(3) එහි 5 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"5. යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල නිෂ්පාදිත හෝ වෙළඳපොලේ පවතින තොගයේ උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය ;

එසේ වුවද, මේ නියෝග පළ කරනු ලබන දින සිට දින හතළිස් පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල උපලේඛන ගත වෛද්‍ය උපකරණවල වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය." ;

(4) එහි 6 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"6. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය.";

(5) එහි 7 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"7. උපලේඛනගත වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණ සන්තකයේ තබාගෙන සිටින සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක්, ඇතුළු යම් වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකුගේ ම වගකීම විය යුතු ය." ;

(6) එහි 8 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"8. උපලේඛනගත වෛද්‍ය උපකරණවල වෙළඳ නාමය, මාදිළිය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සහ උපලේඛනගත වෛද්‍ය උපකරණවල එම වෙළඳ නාමයේ, මාදිළියේ, ප්‍රමාණයේ හෝ ඇසුරුමේ ප්‍රමාණයේ උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් එම වෙළඳ නාමයෙන්, මාදිළියෙන්, ප්‍රමාණයෙන් හෝ ඇසුරුමේ ප්‍රමාණයෙන් වන උපලේඛනගත වෛද්‍ය උපකරණ සඳහා වන මිල නියම කරනු ලැබිය යුතු ය." ;

(7) "වෛද්‍ය වෘත්තිකයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"තැනැත්තා" යන්නට සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;" ; සහ

(8) උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

**"උපලේඛනය**

(2 වන නියෝගය)

**තෝරාගත් වෛද්‍ය උපකරණ දෙකක උපරිම සිල්ලර මිල**

| *අංකය* | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | *අනුමත නාමය* | *උපරිම සිල්ලර මිල (MRP)*<br>*(ශ්‍රී ලංකා රුපියල්)* |
| 1 | රුධිර ග්ලූකෝස් මාපක | එක් ඒකකයක්<br>රු. 4,429.22 |
| 2 | රුධිර ග්ලූකෝස් මාපකවල භාවිත කරන පරීක්ෂණ තීරු | එක් පරීක්ෂණ තීරුවක්<br>රු. 80.15 |

EOG 03 - 1012/3

එල්.ඩී.බී. 9/2016 (III)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2021 සැප්තැම්බර් මස 04 වන දින අංක 2243/20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 අංක 1 දරන වෛද්‍ය (වෛද්‍ය උපකරණ මිල නියම කිරීම) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. (1) යම් වෙළඳ නාමයකින්, මාදිළිවලින්, ප්‍රමාණවලින් හෝ ඇසුරුම් ප්‍රමාණවලින් විස්තර කර ඇති (මෙහි මින්මතු "උපලේඛනගත වෛද්‍ය උපකරණය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුමත නාමයෙන් වන වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ II වන තීරයේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) උපලේඛනගත වෛද්‍ය උපකරණය සන්තකයේ තබාගෙන සිටින නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඖසුසලක් හෝ තැනැත්තකු විසින් එම උපලේඛනගත වෛද්‍ය උපකරණය මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට හෝ මේ නියෝගයේ (4) වන අනු නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශෝධිත සිල්ලර මිලට වඩා වැඩි මිලකට විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අය කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණය සන්තකයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඖසුසලක් හෝ තැනැත්තකු විසින් උපලේඛනගත වෛද්‍ය උපකරණයේ මිල, උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිලෙහි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(4) මේ නියෝග පළකරනු ලබන දිනයේ දී, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩුවන්නා වූ, 2021 සැප්තැම්බර් මස 04 වන දින අංක 2243/20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 අංක 1 දරන වෛද්‍ය (වෛද්‍ය උපකරණ මිල නියම කිරීම) නියෝග යටතේ වන ප්‍රතිශෝධිත සිල්ලර මිලකට යම් වෛද්‍ය උපකරණයක් විකුණනු ලබන නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් එම ප්‍රතිශෝධිත සිල්ලර මිල, සමානුපාතිකව සම්පූර්ණ වශයෙන් සියයට විසිනවයක ප්‍රතිශතයකින් (29%) වැඩි කරනු ලැබිය හැකි ය.

එසේවුව ද, උපලේඛනගත වෛද්‍ය උපකරණවල ප්‍රතිශෝධිත සිල්ලර මිලෙහි එවැනි වැඩි කිරීමක් මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල නොඉක්මවිය යුතු ය." ;

(2) එහි 3 වන සහ 4 වන නියෝග ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"3. යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින්, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල නිෂ්පාදිත හෝ වෙළෙඳපොලේ පවතින

තොගයේ උපලේඛනගත වෛද්‍ය උපකරණයේ වෙළෙඳ ඇසුරුම හෝ ලේබලය මත ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය ;

එසේවුව ද, මේ නියෝග පළකරනු ලබන දින සිට දින හතලිස් පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල උපලේඛනගත වෛද්‍ය උපකරණයේ වෙළෙඳ ඇසුරුම හෝ ලේබලය මත මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.'' ;

(3) එහි 6 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''6. උපලේඛනගත වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම විකිණීමේ කාර්යය සඳහා උපලේඛනගත වෛද්‍ය උපකරණය සන්තකයේ තබාගෙන සිටින සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක, ඔසුසලක හෝ තැනැත්තකුගේම වගකීම විය යුතු ය.'' ;

(4) එහි 8 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය අදේශ කිරීමෙන් :-

''8. උපලේඛනගත වෛද්‍ය උපකරණයේ වෙළඳ නාමය, මාදිළිය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සහ උපලේඛනගත වෛද්‍ය උපකරණයේ එම වෙළෙඳ නාමයේ, මාදිළියේ, ප්‍රමාණයේ හෝ ඇසුරුමේ ප්‍රමාණයේ උපරිම සිල්ලර මිල මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින්, එම වෙළඳ නාමයෙන්, මාදිළියෙන්, ප්‍රමාණයෙන් හෝ ඇසුරුමේ ප්‍රමාණයෙන් වන උපලේඛනගත වෛද්‍ය උපකරණය සඳහා වන මිල නියම කරනු ලැබිය යුතු ය.'' ;

(5) එහි 9 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''9. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලබන අතර, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය.'' ;

(6) එහි 10 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''10. මේ නියෝගවල -

''වෛද්‍ය වෘත්තිකයා'' යන්නට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''තැනැත්තා'' යන්නට සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ; සහ

''පෞද්ගලික වෛද්‍ය ආයතනය'' යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**උපලේඛනය**

(2 වන නියෝගය)

**තෝරාගත් වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල**

| *අංකය* | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | *අනුමත නාමය* | *ඒකකයක උපරිම සිල්ලර මිල (MRP) (ශ්‍රී ලංකා රුපියල්)* |
| 1. | පල්ස් ඔක්සිමීටරය | රු. 3,870.00 |

EOG 03 - 1012/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.